JMC vLearning
"your virtual learning partner"

# කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර

## AAT අදියර I

## BEN - ව්‍යාපාර පරිසරය

තරංග ජයනන්ද
B.Sc. (Business Administration) Sp. (USJP)

JMC ජයසේකර කළමනාකරණ මධ්‍යස්ථානය
JAYASEKERA MANAGEMENT CENTRE (PVT) LTD
Estd. 1972

JMC Jayasekera Management Centre (Pvt) Ltd
Pioneers in Professional Education
65/2A, Chittampalam Gardiner Mawatha, Colombo 02 | T: +94 112 430451 | E: info@jmc.lk | F: +94 115 377917

JMC vLearning
"your virtual learning partner"

# කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර

තරංග ජයනන්ද

## සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර




කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල අර්ථ දැක්වීම එම සාධකවල ප්‍රමාණාත්මක ස්වභාවය අනුව තීරණය වන බැවින් රටින් රටට කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අර්ථ දක්වන ආකාරය වෙනස් වේ

කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර පිළිබඳ සම්මත ජාත්‍යන්තර අර්ථ දැක්වීමක් නොමැති අතර කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වන නිර්වචනය ප්‍රතිපත්ති සම්පාදකයන්ට හා මූල්‍ය ආයතන වලට ඔවුන්ගේ තීරණ ගැනීම සඳහා ඉතා වැදගත් වේ

සේවයේ යොදවා ඇති සේවකයන්/පුද්ගලයන් සංඛ්‍යාව, ආයෝජිත ප්‍රාග්ධනයේ ප්‍රමාණය, පිරිවැටුමේ ප්‍රමාණය, ව්‍යාපාරයේ ස්වභාවය සහ යන්ත්‍ර හා උපකරණ වල ආයෝජිත ප්‍රමාණය යන විවිධ වූ පරාමිතීන් යොදා ගනිමින් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර විවිධ රටවල් විසින් ඔවුන්ගේ සංවර්ධනය මත විවිධාකාරයෙන් අර්ථ දක්වා ඇත.

©JMC vLearning


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

## සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අර්ථ දැක්වීම

- කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර යනු, දෙන ලද සේවක සංඛ්‍යාවට වඩා අඩු සේවක සංඛ්‍යාවක් සේවය කරනු ලබන පරිපාලිත නොවන ස්වාධීන ව්‍යාපාර ආයතනයකි

  ආර්ථික සහයෝගීතාව හා සංවර්ධනය සඳහා වූ සංවිධානය (OECD)

- ඕනෑම ව්‍යාපාරයක සේවය කරන පුද්ගලයින් සංඛ්‍යාව 99 ට වඩා අඩු නම් එය කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ලෙස අර්ථ දක්වයි වෙළෙඳාම නිසා රැකියා අවස්ථා ජනිත කරයි

  ලෝක බැංකුව

- වාර්ෂික විකුණුම් පිරිවැටුම ඩොලර් මිලියන (100) ට අඩු හෝ සේවයකරනු ලබන සේවක සංඛ්‍යාව (200) ට වඩා අඩු ව්‍යාපාර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර වේ.

  සිංගප්පූරුව

©JMC vLearning

## ශ්‍රී ලංකාවේ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අර්ථ දැක්වීම

ශ්‍රී ලංකාව තුළ ගත වූ කාල සීමාව ඇතුලත, නොයෙක් ආයතන විසින් විවිධ වූ අර්ථ දැක්වීම ස්ථාපනය කොට ඇති අතර මෙම නිර්වචන කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අර්ථ දැක්වීමට ස්ථිරව භාවිතා කල හැකි පරාමිතීන් ලෙස නොසැලකේ

කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යංශය විසින්, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සංවර්ධනය සඳහා වන ජාතික ප්‍රතිපත්ති රාමුව යටතේ (2015) දී කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා අර්ථ දැක්වීමක් සකස් කර ඇති අතර මෙය ශ්‍රී ලංකාවේ පිළිගත් අර්ථ දැක්වීමක් ලෙස සැලකේ

| අංශය | නිර්ණායකය | මධ්‍ය | කුඩා | ක්‍ෂුද්‍ර |
|---|---|---|---|---|
| භාණ්ඩ නිෂ්පාදන | වාර්ෂික පිරිවැටුම | රු.මි. 251 - 750 | රු.මි. 16 - 250 | රු.මි 15ට වඩා අඩු |
| | සේවක සංඛ්‍යාව | 51 - 300 | 11-50 | 10 ට වඩා අඩු |
| සේවා | වාර්ෂික පිරිවැටුම | රු.මි 251 - 750 | රු.මි 16 - 250 | රු.මි 15ට වඩා අඩු |
| | සේවක සංඛ්‍යාව | 51 - 200 | 11-50 | 10 ට වඩා අඩු |

©JMC vLearning


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

## විවිධ ණය සපයන ආයතන ණය ලබා දීමේ දී කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර හඳුනා ගැනීමට භාවිතා කරන ණය රේඛාවන්

| ණය රේඛාවේ නම | වර්ෂය | නිර්ණායකය හා වටිනාකම | | |
|---|---|---|---|---|
| | | ස්ථාවර වත්කම් සඳහා ආයෝජනය | වාර්ෂික පිරිවැටුම | සේවක සංඛ්‍යාව |
| SMILE I | 1995 | රු.මි. 10 | | |
| SMILE II | 2001 | රු.මි. 14 | | |
| SMILE III | 2005 | රු.මි. 20 | | |
| SMEDP | 2003 | රු.මි. 35 | | |
| SMERDP | 2008 | රු.මි. 100 | රු.මි. 300 | 150 |
| SMEDeF | 2011 | | රු.මි. 300 | |
| MSME – KFW | | රු.මි. 50 | | |

මූලාශ්‍රය - කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සංවර්ධනය සඳහා වන ජාතික ප්‍රතිපත්ති රාමුව, කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යංශය

©JMC vLearning

## රජය විසින් උපාය මාර්ගික අංශයක් ලෙස කුඩා හා මධ්‍ය ව්‍යාපාර හඳුනාගැනීම තුල කුඩා හා මධ්‍ය ව්‍යාපාර වර්ධනය කිරීමෙන් ලඟාකර ගැනීමට බලා පොරොත්තු වන අරමුණු



- ආර්ථික වර්ධනය
- කලාපීය සංවර්ධනය
- රැකියා උත්පාදනය
- දරිද්‍රතාවය අවම කිරීම.







©JMC vLearning


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

## කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර වල වැදගත්කම

1. රටෙහි ජාතික නිෂ්පාදනයට දායක වීම
   - ලෝක බැංකු වාර්තාවට අනුව විධිමත් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර නැගී එන ආර්ථිකයන්හි ජාතික ආදායමෙන් (දළ දේශීය නිශ්පාදිතයෙන් 40%) ක් දක්වා දායක වේ

     අවිධිමත් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ඇතුලත් කල විට මෙම ප්‍රතිශතය සැලකිය යුතු ලෙස වැඩිය. ශ්‍රී ලංකාවේ දළ දේශිය නිශ්පාදිතයෙන් (52%) කට ආසන්න ප්‍රමාණයක් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර වේ. එය අනෙකුත් දකුණු ආසියානු හා ගිනිකොණදිග ආසියානු රටවලට සාපේක්ෂව ඉහළ අගයකි.

2. රැකියා අවස්ථා නිර්මාණය කිරීම
   - ශ්‍රී ලංකාවේ ආර්ථිකයේ සමස්ථ රැකියා උත්පාදනයෙන් (45%) ක් පමණ උත්පාදනය කරනු ලබන්නේ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර වලිනි

©JMC vLearning

3. දේශීය ආයෝජනයන් වර්ධනය වීම හා ඉතුරුම් ඒකරාශී වීම
   - කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර හේතුවෙන් ඉතුරුම් ආයෝජනයන් බවට පරිවර්තනය වීම සිදුවේ
4. දුප්පත්කම තුරන් කිරීම
   - කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර හේතුවෙන් පුද්ගල ආදායම් ඉහළ යාම හේතුවෙන් දිළිඳුකම අඩු වීම සිදු වේ
5. සාධාරණ ආදායම් ව්‍යාප්තියක් ඇති කිරීමට හේතුවීම
   - කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර රැකියා උත්පාදනය සඳහා දායක වේ. විශේෂයෙන් අර්ධ නිපුණතා නුපුහුණු ශ්‍රමය යොදාගනිමින් ව්‍යාපාර කටයුතු සිදු කරන බැවින් සමාජයේ අඩු ආදයම්ලාභී පාර්ශවයන්ගේ ආදායම් ඉහළ යාමෙන් ආදායම් බෙදීයාමේ විෂමතාවයන් ඉවත් කල හැකි වේ

©JMC vLearning

6. කලාපීය සංවර්ධනයට දායක වීම

- රැකියා උත්පාදනය කිරීම, දරිද්‍රතාවය තුරන් කිරීම, ආයෝජනයන් ඉහළ යාම ආදියත් තුලින් කාලාපීය රටවල් අතර ඇති වන ආර්ථික වර්ධනයයි

7. ආර්ථිකයන්හි නම්‍යශීලී බව හා නව වෙනස්වීම් වලට අනුවර්ථනය වීමේ හැකියාව වර්ධනය වීම

- කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල එක් සුවිශේෂී ලක්ෂණයක් වන්නේ ඒවායේ නම්‍යතාවයයි. මෙම ව්‍යාපාරවල වෙනස් කිරීමට පහසු සරල කළමනාකරණ ව්‍යුහයක් පවතින බැවින් ඉතා ඉක්මණින් පරිසර වෙනස්වීම් වලට අනුවර්තනය වීමට මෙම ව්‍යාපාර වලට හැකියාව පවතී

8. මහා පරිමාණ ව්‍යාපාරවල පැවැත්මට

9. දේශීය හා ප්‍රාදේශීය සම්පත් වලින් ප්‍රයෝජන ගැනීමට

10. නාගරීකරණයට විසඳුමක් වීම

©JMC vLearning

11. මහා පරිමාණ ව්‍යාපාර යොමු නොවන වෙළඳපොළ පරාස වලට භාණ්ඩ සැපයීම

12. අපනයන විවිධාංගීකරණය දිරිගැන්වීම

13. නිෂ්පාදිත වල ගුණත්වය ඉහළ නැංවීමට.

## ශ්‍රී ලංකාවේ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල කාර්ය සාධනය

උපායමාර්ගික අංශයක් ලෙස කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සලකනු ලබන බැවින් ආර්ථික හා සමාජ සුභසාධනයෙහිලා කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර විශිෂ්ඨ දායකත්වයක් සපයයි

- දළ දේශීය නිශ්පාදිතය සඳහා ඉහළ දායකත්වයක් ලබා දීම
- රැකියා උත්පාදනය තුලින් සේවා වියුක්තිය අවම කිරීම
- අගය එකතු කිරීම නිසා ආර්ථික වර්ධනයට හේතු වීම
- කාර්මික අංශයේ නිමවුම් වර්ධනයට දායකත්වය ලබා දීම
- අපනයන ආදායම් ඉහළ යාමට හේතු වීම.

©JMC vLearning


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

**කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල කාර්යය සාධනය ඉහළ නැංවිය හැකි ආකාර /කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට සහාය වීම සහ දිරිගැන්වීම ශ්‍රී ලංකා රජය විසින් ගෙන ඇති ක්‍රියා මාර්ග (ප්‍රතිපත්තිමය මැදිහත් වීම්)**

1. පරිසරය සක්‍රීය කිරීම

- කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සංවර්ධනය සඳහා හිතකර වාතාවරණයක් ඇති කිරීම සඳහා තරඟකාරීත්වය සහ සහයෝගීතාවය වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය නීතිමය හා ප්‍රතිපත්තිමය රාමුවක් ගොඩ නැංවීම

උදාහරණ

ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය NEDA

National Enterprise Development Authority
Ministry of Industries

- මූල්‍යමය පහසුකම් ලබා දීම
- ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණු වැඩසටහන් පැවැත්වීම.

©JMC vLearning

කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකත්ව මණ්ඩලය

- විදේශ වෙළෙඳපොළ පහසුකම් සපයා දීම.

අපනයන සංවර්ධන මණ්ඩලය

EDB

- අලෙවි පහසුකම්
- උපදේශන සේවා
- විදේශ වෙළෙඳපලවල් පිළිබඳ තොරතුරු සැපයීම
- නව වෙළෙඳපොළවල් හඳුන්වා දීම
- අපනයනකරුවන්ට ජාත්‍යන්තර වෙළෙඳපොළ සල්පිල හා ප්‍රදර්ශන වලට සහභාගීවීමට අවස්ථාව සලසා දීම.

කාර්මික සංවර්ධන මණ්ඩලය

INDUSTRIAL DEVELOPMENT BOARD
Ministry of Industries

- උපදේශන සේවා
- තාක්ෂණික දැනුම ලබා දීම
- යටිතල පහසුකම්.

©JMC vLearning


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය

- උපදේශන සේවා.

ජාතික සංවර්ධන බැංකුව

- මූල්‍ය පහසුකම් ලබා දීම.

කාර්මික තාක්ෂණ ආයතනය

- තාක්ෂණික දැනුම ලබා දීම
- උපදේශන සේවා සැපයීම
- නව නිෂ්පාදිත සඳහා රසායනාගාර පරීක්ෂාව ලබා දීම
- උපකරණ ක්‍රමාංකනය
- තත්ත්ව පාලන ක්‍රම පිලිබඳ තොරතුරු ලබා දීම.

©JMC vLearning

ශ්‍රී ලංකා සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත මණ්ඩලය SLCSMI

- මූල්‍ය පහසුකම් සැපයීම
- පුහුණු වැඩසටහන් පැවැත්වීම
- උපදේශන සේවා
- වෙළෙඳ සල්පිල් පැවැත්වීම
- විශිෂ්ටතා සම්මාන ලබා දීම.

ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය NERD Centre

- ජාතික නිෂ්පාදන ක්‍රම හඳුන්වා දීම
- නිෂ්පාදන තාක්ෂණික ක්‍රමවල ඇතිවන ගැටළු නිරාකරණය කිරීම
- නවීන තාක්ෂණික ක්‍රම හඳුන්වා දීම.

ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය

- සාම්ප්‍රදායික නිෂ්පාදන ක්‍රම ආරක්ෂා කිරීම
- ලෝක වෙළෙඳපොලට ගැලපෙන ලෙස නිෂ්පාදිත සංවර්ධනය
- ලෝක වෙළෙඳපොලට ගැලපෙන ලෙස භාණ්ඩ නිෂ්පාදනයට අවස්ථාව සැලසීම.

©JMC vLearning

ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය NAITA

- වෘත්තීය පුහුණු පාඨමාලා පැවැත්වීම
- වෘත්තීය පුහුණුවට අදාල ප්‍රමිත ස්ථාපනය NVQ
- වෘත්තීය පුහුණුවට සම්බන්ධ පර්යේෂණ පැවැත්වීම
- වෘත්තීය පුහුණුවට අදාල විභාග පැවැත්වීම .

ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය VTA

- ආධුනිකයන් හට වෘත්තීය පුහුණුව ලබාදීම
- ස්වයං රැකියාවක් ආරම්භ කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම
- උපදේශන වැඩසටහන් පැවැත්වීම
- පුහුණු කිරීමේ වැඩසටහන් පැවැත්වීම.

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය.

- විවිධ යටිතල පහසුකම් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම හා මූල්‍යනය කිරීම .

©JMC vLearning

2. නවීන සුදුසු තාක්ෂණය හඳුන්වා දීම
   - කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සඳහා යෝග්‍ය තාක්ෂණික භාවිතයන් හඳුන්වා දීම සඳහා විවිධ ක්‍රියාමාර්ග ගැනීම මින් අදහස් වේ
3. ව්‍යවසායකත්ව සංස්කෘතිය හා නිපුණතා සංවර්ධනය
   - ව්‍යවසායකයින්ට පහසුකම් සැපයීමේ අරමුණින් පාසල් විශ්ව විද්‍යාල වෘත්තීය පුහුණු ආයතන ධාරිතාවය ඉහළ නැංවීම හා ඒ සඳහා වන නව පාඨමාලා හඳුන්වා දීම ද සිදු කරයි
4. මුදල් සඳහා ප්‍රවේශය (මූල්‍යමය දිරිගැන්වීම් ලබා දීම)
   - කෙටිකාලීන හා දිගුකාලීන බැංකු ණය පහසුකම්
   - විශේෂ ණය යෝජනා ක්‍රම
   - මූල්‍යමය ආධාර
   - බදු සහන හා බදු ප්‍රතිදාන
   - ප්‍රතිමූල්‍ය පහසුකම්
   - කල්බදු හා අයිරා පහසුකම්

©JMC vLearning

5. වෙළඳපොළ/ අලෙවි පහසුකම්

- ව්‍යාපාරයේ නිෂ්පාදිත සඳහා විකුණුම් අවස්ථා සැලසීම වේ. වෙළඳපොළ පර්යේෂණ, ගැණුම්කරුවන් මුණගැස්වීම, වෙළඳ ප්‍රදර්ශන විදේශ වෙළඳ සංචාර මේ යටතේ සැපයේ

6. පර්යේෂණ හා සංවර්ධනය (පරීක්ෂණ හා තාක්ෂණික සේවා)

- ව්‍යාපාර ක්‍රියාවලිය සඳහා අවශ්‍ය තාක්ෂණික ඥාණය සැපයීම මින් අදහස් වේ නිෂ්පාදන ක්‍රම නව යන්ත්‍රෝපකරණ භාවිතය, බලශක්තිය පිරිමැසීම, ඇසුරුම් ක්‍රම, පිරිවැය අඩු කිරීම, තත්ත්ව පාලනය, පරිගණක භාවිතය යනාදිය සඳහා තාක්ෂණික සේවා සැපයේ

7. උපාය මාර්ගික සම්පත් වැඩි දියුණු කිරීම තුළින් තරගකාරීත්ව වාසීන් ඇති කර ගැනීමට අවස්ථාව ලබා දීම

- මෙමගින් මහා පරිමාණ ව්‍යාපාර සමඟ මෙන්ම විදේශීය ව්‍යාපාර සමඟ ද ඉතා හොඳින් තරඟ කිරීමේ හැකියාව වර්ධනය කරන අතර එය සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරය ප්‍රවර්ධනයට බෙහෙවින් වැදගත් වේ.

©JMC vLearning

## ශ්‍රී ලංකාවේ කුඩා ව්‍යාපාරිකයන් මුහුණපාන පොදු ගැටළු/ ශ්‍රී ලංකාවේ කුඩා ව්‍යාපාර අසාර්ථක වීමට හේතු

1. සැළසුම්කරණ/ කළමනාකරණ දුර්වලතා

- ක්‍රමවත් සැළසුමකට අනුව ක්‍රියාත්මක නොවීමයි. එනම් කළමනාකරණය කෙරෙහි අඩු සැලකිල්ලක් දැක්වීම හා කළමනාකරණ ශිල්ප ක්‍රම පිළිබඳ අවබෝධයක් නොමැති වීමයි

2. මූල්‍ය පහසුකම් ලබා ගැනීමේ දුෂ්කරතා

- මහා පරිමාණ ව්‍යාපර වලට මෙන් මූල්‍ය වෙළඳපොළ තුළින් ප්‍රාග්ධනය සපයා ගැනීමේ ක්‍රමයක් සුළු ව්‍යාපාරිකයන්ට නොමැති වීමයි. එනම් සුළු ව්‍යාපාර සඳහා ඇති මූල්‍ය මාර්ග සීමිත වීම හා බැංකු වැනි මූල්‍ය ආයතන ඉහළ ඇප සුරැකුම්පත් ඉල්ලා සිටීමයි

3. ප්‍රමාණවත් මානව සම්පත් සපයා ගැනීමේ දුෂ්කරතා

- ඉහළ දක්ෂතා හා කුසලතා සහිත සේවකයින් ලබා ගැනීමට නොහැකි වීමයි

©JMC vLearning

4. අලෙවිකරණ/ වෙළඳපොළ ගැටළු

- විවෘත ආර්ථික ක්‍රමය තුළ ඇතිවී තිබෙන තරඟකාරීත්වයට මුහුණ දීමට අවශ්‍ය දැනුම හා කුසලතා නොමැති වීමයි. විවිධාංගීකරණ , ප්‍රවර්ධන, බෙදා හැරීමේ උපාය මාර්ග මෙන්ම විදේශ වෙළඳපොළ පිලිබඳව දැනුම නොමැති වීමයි

5. නව තාක්ෂණය භාවිතා නොකිරීම

- පවුල, කුලය හෝ සමාජය මූලිකව ඇති වූ බොහෝ ව්‍යාපාරවල නිෂ්පාදන කටයුතු සඳහා පාරම්පරික හා සාම්ප්‍රදායික ක්‍රම යොදා ගැනීම නිසා ඵලදායීතාවය අඩු මට්ටමක පවතී. නිෂ්පාදනය පුළුල් කිරීමට, පිරිවැය අඩු කිරීමට හෝ ගුණත්වය වැඩි කිරීමට අවශ්‍ය නව තාක්ෂණය සිය නිෂ්පාදනය සමඟ මිශ්‍ර කිරීමට ප්‍රමාණවත් පුහුණුවක් මෙම ව්‍යාපාරිකයින් සතුව නොමැත

6. නවීකරණයන් හා නව්‍යතා සම්පාදනයන් සිදු නොකිරීම

- පවත්නා නිෂ්පාදිත ඒ අයුරින්ම පවත්වාගෙන යාම හා ඒවා නවීකරණය කිරීම හෝ නවෝත්පදන සඳහා කටයුතු නොකිරීමයි

©JMC vLearning

7. පරිසර වෙනස් වීම් වලට අනුගත නොවීම

- නිරන්තරයෙන් වෙනස් වන පරිසරය තුළින් ඉස්මතු වන අවස්ථා හඳුනාගෙන ඉන් ප්‍රයෝජන ගැනීමට මෙන්ම පරිසරය තුළින් උත්ගත වන තර්ජන කල්තියා හඳුනාගෙන ඒවාට සාර්ථකව මුහුණ දීමට පෙර සූදානමක් ඇතිකර ගැනීමට කුඩා ව්‍යාපාරිකයින් දක්ෂ නොවීම ප්‍රබල ගැටළුවකි

8. ව්‍යවසායකත්ව හුදකලා බව

- තනිව වැඩි කාලයක් ව්‍යාපාර කටයුතු සඳහා වැය කිරීමට සිදු වීම හා පවුලේ හා සේවක සහභාගීත්වය අවම මට්ටමක පැවතීම මින් අදහස් වේ

9. මහා පරිමාණ ව්‍යාපර සමඟ තරඟ කළ නොහැකි වීම

- මහා පරිමාණ ව්‍යාපාර විවිධ ක්ෂේත්‍ර වල ව්‍යාපාර කටයුතු ව්‍යාප්ත කිරීම නිසා ඒවා සමඟ තරඟ කිරීම ඉතා අපහසු වීම

10. ඉලක්ක ගනුදෙනුකරුවන් ආකර්ෂණයට හා රඳවා ගැනීමට අපොහොසත් වීම

- බොහෝමයක් කුඩා ව්‍යාපාරිකයෝ ගනුදෙනුකරු කේන්ද්‍රගතව කටයුතු නොකරයි තම ඉලක්ක වෙළෙඳපොළ ගැන ඇත්තේ අඩු අවබෝධයකි.

©JMC vLearning


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

## ශ්‍රී ලංකාවේ කුඩා ව්‍යාපාර අසාර්ථක වීමට හේතු

අභ්‍යන්තර සාධක

- දුර්වල සැලසුම්
- නම්‍යශීලී නොවීම
- කළමනාකරණ කුසලතා හා තීක්ෂණ බුද්ධිය නොමැතිකම
- නුසුදුසු පෞද්ගලික චරිත ලක්ෂණ
- ව්‍යාපාරය දෙවන පරම්පරාවට ගෙන යාමට යෝග්‍ය අනුප්‍රාප්තික සැලසුම් නොමැතිකම
- මූල්‍ය විනය නොමැතිකම
- දුර්වල වාර්තා තබා ගැනීම
- පර්යේෂණ හා නවෝත්පාදන නොමැතිකම
- දුර්වල කාරක ප්‍රාග්ධන කළමනාකරණය හා නුසුදුසු මුදල් ප්‍රවාහ විශ්ලේෂණය.

©JMC vLearning

ක්ෂණික පාරිසරික සාධක

- සැපයුම්කරුවන් නිවැරදිව සම්බන්ධීකරණය නොකිරීම
- ව්‍යාපාර වලට ලැබෙන සේවාවල ගුණාත්මකභාවයේ මද බව
- ණය ලබා දීමේදී මූල්‍ය ආයතන වලින් ඉදිරිපත් කරන දැඩි අනම්‍ය අවශ්‍යතා
- ප්‍රධාන පාරිභෝගිකයාගේ හෝ සැපයුම්කරුවන්ගේ බිඳවැටීම්.

සාර්ව සාධක

- මූල්‍ය හා මූල්‍ය ප්‍රතිපත්තිවල වෙනස්වීම්
- බදුකරණය සම්බන්ධයෙන් රජයේ ප්‍රතිපත්තිවල වෙනස්වීම්
- ලෝක බැංකුව, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, ආසියානු සංවර්ධන බැංකුව වැනි ආධාර දෙන ජාත්‍යන්තර ආයතනවල සහාය නොමැතිකම
- රටවල් අතර සහ රටවල් තුළ ගැටුම් ඇතිවීම.

©JMC vLearning